# අන්දරේ සහ කරණවෑමියා

අන්දරේලගෙ ගමේ කරණවැමියා හිටියෙ අන්දරේගෙ ගෙවල් ළඟ. අන්දරේ පොඩි කාලෙ, දවසක් ඔහු හිතුවා කරණවැමියට පොඩි විහිළුවක් කරන්න ඕනෑ කියලා.

ඉතින් හිතන්න පුළුවන් ද අන්දරේ මොකක්ද කළේ කියලා?

ඔහු කරණවැමියාගෙ ගෙදර ගියා.

"ආ ! මොකද අන්දරේ මේ පැත්තෙ?" කියලා කරණවැමියා ඇහුවා.

"මගෙ රැවුල බාන්ඩ නේ! වෙන අහවල් දෙයකටයැ," අන්දරේ කිව්වා.

"හැබෑ මයි, අහන්නත් දෙයක්යැ, එන්න එන්න, මේ පුටුවෙන් වාඩි වුණානන්," කරණවැමියා කිව්වා.

ඉතින් ඒ ලොකු පුටුවෙ අන්දරේ ඉඳගත්තා ලොකු මිනිහකු වගේ. ඔහු කරණවැමියාට ඉක්මනින් රැවුල කපන්න කිව්වා.



"හොඳමයි අන්දරේ," කියලා කරණ්ඩවැමියා කිව්වෙ දෙකට නැමිලා, හිස පාත් කරලා,

ඊට පස්සෙ ඔහු අන්දරේගෙ කර වටා රෙද්දක් බැන්දා. බිම පිහදාන කොස්ස අරගෙන ඒක සබන් වතුරේ ඔබලා අන්දරේගෙ මූණෙ සබන් පෙණ එන්ට ඇතිල්ලුවා. එහෙම තියෙද්දි ඔහු වෙනත් වැඩක් කරන්න පටන් ගත්තා.

රැවුල බාන්න එනකම් අන්දරේ බලන් හිටියා. හුඟක් වෙලා බලන් හිටියා. කෝ - කරණ්ඩවැමියා ආවෙ නෑ - අන්දරේට දැන් කේන්ති ගියා.

"රැවුල බාන්න එන්නෙ නැතුව මොනවා ද ඔය කරන්නෙ? ඉක්මනට ඇවිත් මගෙ රැවුල බානවා," අන්දරේ කේන්තියෙන් කිව්වා.

"මම මේ බලන් ඉන්නෙ අන්දරේගෙ මූණෙ රැවුල වැවෙනකම් නේ!" කරණ්ඩවැමියා උත්තර දුන්නා.

අන්දරේට කරකියා ගන්න දෙයක් නැති වුණා. මූණෙ තිබුණ සබන් පෙණ වේළෙනකම් ඉඳලා ඔහු හෙමින් සැරේ නැඟිටලා යන්න ගියා.